සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

29 S I

කාලය: පැය දෙකයි

විභාග අංකය: ..................................................

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුරු තෝරාගෙන එය සපයා ඇති කොටු පත්‍රයේ කතිරයක් යොදා දක්වන්න.

01. සන්නිවේදන ක්‍රියාවලියේ දී ප්‍රතිපෝෂණයේ වැදගත්කම පෙන්වා දෙන ලද්දේ,

1. ජොර්ජ් ගාබ්නර්
2. ශ්‍රාම් - ඔස්ගුඩ්
3. එඩ්වඩ් සැපිර්
4. ෂැනොන් හා විවර්
5. හැරල්ඩ් ඩී. ලැස්වෙල්

02. පණිවිඩයක් කේත බවට පරිවර්තනය කිරීම

1. විකේතකරණයයි.
2. අකේතකරණයයි
3. පරිවර්තනයයි
4. වර්තාකරණයයි
5. ප්‍රතිපෝෂණයයි

03. ජන සන්නිවේදනය මගින් ඉටු කරන ප්‍රයෝජනය 04ක් ජනමාධ්‍ය අධ්‍යයනයේ දී හඳුනා ගත හැකිය. ඊට අයත් නොවන්නේ,

1. ප්‍රජානනයයි.
2. අපසරණයයි.
3. නිෂ්කර්ෂණයයි.
4. වියුක්තිකරණයයි.
5. සමාජ උපයෝගතාවයයි.

04. ජනමාධ්‍ය ඉටු කෙරෙන කාර්යය වන්නේ,

1. පෙර සම්බන්ධය
2. පසු සම්බන්ධය
3. සහ සම්බන්ධය
4. මිශ්‍ර සම්බන්ධය
5. සූර සම්බන්ධය

05. සන්නිවේදන ස්වභාවය හඳුන්වා දිමේදී නොගැලපෙන අදහස වන්නේ,

1. සන්නිවේදන අරමුණ සහගතයි
2. සන්නිවේදන විසමමුතිය මත ඇති වීමයි.
3. සන්නිවේදනය විවිධාකාර වීම
4. සන්නිවේදනය සන්දර්භානුගත වීම
5. සන්නිවේදනය බලයක් සහිත වීම.

06. නිර්මාණාත්මක සංදේශයක දැකිය හැකි වඩාත්ම වැදගත් ලක්ෂණය වන්නේ,

1. අපූර්වත්වය
2. කල්පිත බව
3. විචිත්‍ර බව
4. ප්‍රාසාංගික බව
5. චිත්‍රරූප මැවීමට හැකි වීම

07. ජනමාධ්‍ය පිළිබඳ සදොස් ප්‍රකාශය වන්නේ,

1. ග්‍රාහක සාක්ෂරතාව සම මට්ටමේ නොපැවතීම.
2. ග්‍රාහකයා සමාජතීය වීමයි
3. ග්‍රාහකයා සන්දේශයන් පමණක් බැඳීමයි
4. ග්‍රාහකයාගේ වින්දන ක්ෂේත්‍ර විවිධ වීමයි.
5. ග්‍රාහකයාට නායකත්වයක් නොමැති වීමයි.

08. මහජන සම්බන්ධතා පිලිබඳ නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1. සුබවාදී දැනුවත් කිරීම මූලික අරමුණයි.
2. සබඳතා ගොඩ නැංවීම මූලික කාර්යයි.
3. අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීම ප්‍රමුඛ වේ.
4. මුදල් ගෙවා සිදු කරන ප්‍රවර්ධන කාර්යයි.
5. විවිධ පාර්ශවවලට වාසි ගෙන දෙන්නකි.

09. පුවත්පතක දෘශ්‍ය ආකර්ෂණය වඩාත් ප්‍රභල ලෙස යොදා ගත හැකි වන්නේ,

1. කෙටි වාක්‍ය මගිනි.
2. සරල බස් වහරන් මගිනි.
3. දෘඩ පුවත් මගිනි.
4. ඡායාරූප හා වර්ණ මගිනි
5. දෙබස් හා සංවාද මගිනි

10. ක්ෂේත යනු,

1. වාචික සන්නිවේදනය ඉක්ම වූවකි.
2. වෙනත් යමක් නියෝජනය කරන්නකි
3. නර්තනයට අදාල වූවකි.
4. ආගමික අදහස් ඉදිරිපත් කරන්නකි.
5. ශබ්ද නොව රස නියෝජනය කරන්නකි.

11. සන්නිවේදන උපකරණයක් ලෙස ගැමි මාධ්‍ය තුළ දැකිය නොහැක්කේ,

1. ජන විඥානයට සමීප වීමයි.
2. සංවිධානාත්මක බවයි.
3. අවම පිරිවැයයි.
4. සක්‍රීය සහභාගීත්වයයි.
5. සරල ව්‍යුහයයි.

12. අර්බුදකාරී අවස්ථාවක මාධ්‍ය සාකච්ඡාව පවත්වා තොරතුරු හෙළි කිරීම මහජන සම්බන්ධතා ක්‍රමෝපායකි. මෙය ජනමාධ්‍යකරුවාගේ දෘෂ්ටි කෝණයෙන් වඩාත් වැදගත් වන්නේ,

1. තොරතුරු විශාල ප්‍රමාණයක් ලැබෙන බැවිනි.
2. ලබාදෙන තොරතුරු පිළිබඳ ප්‍රශ්න කළ හැකි බැවිනි.
3. බලධාරීන් මුහුණට මුහුණ හමු වන බැවිනි.
4. කෙටි කාලසීමාවක් තුල අවසන් කෙරෙන බැවිනි.
5. සියලුම මාධ්‍යවලට ගැලපෙන පරිදි තොරතුරු නිකුත් කරන බැවිනි.

13. ''නිර්මාණය යනු අලුත් යමක් නිපදවීමේ ක්‍රියාව හෝ ක්‍රියාවලියයි.'' මෙය ඉදිරිපත් කලේ,

1. ලියනාඩෝ ඩාවින්චි
2. ජේම්ස් පෝටර්
3. විල්බර් ග්‍රාම්
4. යුනෙස්කෝව
5. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය

14. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. කථන සන්නිවේදනය තුළ වාචික සන්නිවේදන විධි ඇතුලත්ව තිබිය හැකිය.
2. ලිඛිත සන්නිවේදනය තුල නිර්වාචික සන්නිවේදනය විධි ඇතුලත්ව තිබිය හැකිය.
3. කථන සන්නිවේදනය තුල නිර්වාචික සන්නිවේදනය විධි ඇතුලත්ව තිබිය හැකිය.
4. ලිඛිත සන්නිවේදනය තුල වාචික සන්නිවේදනය විධි ඇතුලත්ව තිබිය හැකිය.
5. ලිඛිත සන්නිවේදනය තුළ කථන සන්නිවේදන විධි ඇතුලත්ව තිබිය හැකිය.

15. අන්තර් සංස්කෘතික සන්නිවේදනයේ වඩාත් වැදගත් කාර්යය වන්නේ,
   1. තම සංස්කෘතික අනන්‍යතාවය උත්කර්ෂයකට ලක් කිරීම.
   2. මානව කේන්ද්‍රවාදය ඉහල නැංවීම.
   3. මිනිසා අවට ලෝකයට අනුවර්තනය කර ගැනීම.
   4. සංස්කෘතික විසරණය තේරුම් ගැනීම.
   5. බහු සංස්කෘතික සමාජයක් ගොඩනංවා ගැනීම.

16. මාධ්‍ය සංස්කෘතිකය පිළිබඳ ගුවන්විදුලි සාකච්ඡාවක් තුල ඉදිරිපත් වූ මතවාද කිහිපයක් පහත දැක්වේ.
   A ස්වභාවික ක්‍රියාවලියකට වඩා සැලසුම්කරන ලද ක්‍රියාවලියකි.
   B බටහිර සංස්කෘතිය මූලාශ්‍රය කරගෙන ඇත.
   C මාධ්‍ය තාක්‍ෂණය සමඟ ප්‍රතිවිරුද්ධව ඇත.
   D සමාජ ගතිකවලට අනුව හැඩ ගැසේ.
   ඉහත අදහස් අතරින් සත්‍ය වන්නේ,
   1. A හා B පමණි. 2. ABCD යන සියල්ලමය. 3. ABC පමණි.
   4. BCD පමණි. 5. ABD පමණි.

17. අයතනික මහජන සම්බන්ධතාවයේදී අවධානය යොමු නොකරන කාර්යය වන්නේ,
   1. ආයතනික කිර්තිය 2. විවිධ මත සාදන්නෝ 3. මාධ්‍ය
   4. දැන්වීම්කරණය 5. ආයතනය හා සම්බන්ධ පාර්ශව වල පිවිසුමයි.

18. සිද්ධිය කළමණාකරය පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.
   A කාල කලමණාකරණය
   B මූල්‍ය කළමණාකරණය
   C දේශපාලන කළමණාකරණය
   D අර්බුද තත්ත්ව කළමණාකරණය
   E මාධ්‍ය මගින් ප්‍රචාරණය
   මේ අතර අවම වැදගත්කමක් දැකිය හැක්කේ,
   1. A වේ 2. B වේ. 3. C වේ. 4. D වේ. 5. E වේ.

19. එක්සත් ජාතීන්ගේ සංවිධානය අන්තර් සම්බන්ධිත සන්නිවේදනය සඳහා සන්නිවේදන ප්‍රවේශ 04ක් සඳහන් කරයි. ඊට ඇතුලත් නොවන්නේ,
   1. හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය
   2. සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනය
   3. නියාමනය සඳහා සන්නිවේදනය
   4. පාරිසරික සමතුලිත තාවය සඳහා සන්නිවේදනය
   5. කාර්මිකරණය සඳහා සන්නිවේදනය

20. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති අදියර කිහිපයක් ක්‍රියාත්මක වේ. එය සංවර්ධනය සඳහා,
   A වියදම් ඇස්තමේන්තු සකස් කිරීම. B ක්‍රියාකාරකම් නියම කිරීම.
   C ආරම්භක හේතු හඳුනාගැනීම. D වැඩ පිළිවෙල සැලසුම් කිරීම.
   E දර්ශක නිර්ණය කිරීම.
   මෙහි අනුපිළිවෙළ වන්නේ,
   1. A,B,C,D,E ය. 2. E,D,A,B,C ය. 3. D,E,C,B,A ය.
   4. C,D,B,E,A ය. 5. C,B,D,E,A ය.

21. එක්තරා පුවත්පතක සංස්කාරක ප්‍රතිපත්ති මෙසේ සඳහන් කොට තිබුණේය.

A රාත්‍රී සාමාජ ශාලා පිළිබඳ ප්‍රවෘත්ති ප්‍රතික්ෂේප කිරීම.

B සුරාසැල් පිළිබඳ දැන්වීම ඇතුලත් නොකිරීම.

C ඇඩ්වටෝරියල් සඳහා ඉඩ නොදීම.

D මළ සිරුරුවල ඡායාරූප පළ නොකිරීම.

ඉහත ප්‍රතිපත්ති හැඳින්වීමට වඩාත් යෝග්‍ය යෙදුම කුමක්ද?

1. ස්වයං නියාමය.
2. ප්‍රකාශක නිදහස
3. වාරණය
4. සදාචාරාත්මක බව
5. නීතිමය බාධක

22. ළමා චිත්‍රපටයක මූලික ලක්‍ෂණ විය යුත්තේ,

1. උපරිම වින්දනයක් ලබා දීමයි.
2. ළමයින් රංගනයට යොදා ගැනීමයි.
3. ළමා මනස තේරුම් ගැනීමයි.
4. සරල කතා වස්තුවක් තිබීමයි.
5. කාටුන් චරිත යොදා ගැනීමයි.

23. රූපණය පදනම් කරගත් ජනශ්‍රැතියකාංගයක් නොවන්නේ,

1. රට යකුම
2. ජන ගී
3. රූකඩ
4. ජන ක්‍රීඩා
5. ජන සංගීතය

24. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. ප්‍රවෘත්තියක් ග්‍රාහකගත වීම දොරටුපාල කාර්යය මත රඳා පවතියි.
2. රූපණය පුද්ගලබද්ධ සංසිද්ධියක් ලෙස දැක්විය හැකිය.
3. නව සමාජ අවශ්‍යතා මාධ්‍ය සංස්කෘතිය මගින් නිරූපනය කරයි.
4. දෙපියවර ආකෘතියේදී ජනමත නායකයන් හා අනුගාමිකයින් සම්බන්ධ වේ.
5. සමූහ සන්නිවේදනය ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් තීරණය වේ.

25. ප්‍රිය සම්භාෂණයකට අවශ්‍ය ඇඳුම් මිලදී ගැනීමට ගිය ව්‍යාපාරිකයෙකු වූ චන්දික දිගුකල් පවත්නා ඇඳුම් වෙනුවට කල් පැවැත්මෙන් අඩු ආකර්ෂණීය ඇඳුමක් මිලට ගත්තේය. මෙම සමාජ ප්‍රවනතාව වන්නේ,

1. රූපවාහිනි වෙළඳ දැන්වීමයි.
2. අධි පරිභෝජන රටාවන්ය.
3. ජනප්‍රිය සංස්කෘතියයි.
4. මාධ්‍ය සංස්කෘතියයි.
5. නව මාධ්‍යයේ වේගවත් බවයි

26. යථාකාර රූපවාහිනි වැඩසටහන් වලට ආවේනික ලක්ෂණයක් වන්නේ,

1. සජීවී වැඩසටහන් වීමයි.
2. අධික පිරිවැයක් සහිත වැඩසටහනක් වීමයි.
3. අධික ජනකාර්ෂණීය වැඩසටහන් වීමයි.
4. සංස්කරණය හා තිර පිටපතක් රහිත වීමයි.
5. මුළුමනින්ම තරුණ්‍යයේ වැඩසටහනක් වීමයි.

27. රූපවාහිනි වැඩසටහන් පිළිබඳ දර්ශක මූලික වශයෙන් පදනම් වන්නේ,

1. ප්‍රේක්ෂක සංඛ්‍යාව බව මතය.
2. වැඩසටහනේ කාල ප්‍රමාණය අනුවය.
3. වැඩසටහනේ වියදම අනුවය
4. ඊට සම්බන්ධ වූ නළු නිළියන් සංඛ්‍යාව අනුවය.
5. වැඩසටහන ආදායම අනුවය.

28. ජනමාධ්‍ය තොරතුරුවල දැකිය හැකි වඩාත් කැපී පෙනෙන ගුණාංගය වන්නේ,

1. දෛනිකත්වය  2. ඓතිහාසිකත්වය  3. සංකීර්ණත්වයයි
4. විශ්‍රාන්තිකත්වය  5. විවිධත්වයයි.

29. ඇමරිකාවේ 1934 දී ස්ථාපනය කරනු ලැබූ ෆෙඩරල් සන්නිවේදන තාක්ෂණ කොමිෂන් සභාවේ ප්‍රමුඛතම අරමුණ වූයේ,

1. ගුවන්විදුලිය හා රූපවාහිනී ආයතනය ප්‍රචලිත කිරීමයි.
2. ගුවන්විදුලිය හා රූපවාහිනී ආයතන වාණිජ අරමුණුවලට මෙහෙය වීමයි.
3. ජනමාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටළු නියාමනය කිරීමයි.
4. සංවර්ධිත අරමුණු සඳහා ජනතාව මෙහෙයවීමයි.
5. ජනමාධ්‍ය ආයතනය අතර තරඟය අඩු කිරීමයි.

30. ජනමාධ්‍යයෙහි පැවති ලිඛිත, ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය-දෘශ්‍ය, අනන්‍යතාව හීන වී යාමට බලපා ඇත්තේ ප්‍රධාන වශයෙන්,

1. මානව සාමජ සංවර්ධනයයි.
2. මාධ්‍ය නිර්මාණකරණයේදී කාලාත්මක ලක්ෂණ සංවර්ධනයයි.
3. මාධ්‍ය තාක්ෂණයේ සංවර්ධනයයි.
4. මාධ්‍ය ආයතන අතර පවත්නා තරඟකාරීත්වයයි.
5. මාධ්‍ය ආචාර ධර්මවල හා නෛතික රාමුවල බලපෑමයි.

31. මාධ්‍යයක ප්‍රධානතම හා මූලික අරමුණ වන්නේ,

1. සියලු සිදුවීම් ග්‍රාහකයන් වෙත වාර්තා කිරීමය.
2. පාලක පන්තියේ දෘෂ්ටිවාදය ප්‍රචාරය කිරීමය.
3. සමාජ අවශ්‍යතා විෂය මූලික තොරතුරු මගින් සංතෘප්ත කිරීමය.
4. සමාජ විඥානය තුළ පුරවැසි සමාජ වටිනාකම තහවුරු කිරීමය.
5. කාලීන ප්‍රශ්න නිරාකරණය සඳහා ග්‍රාහකයින් සන්නද්ධ කිරීම.

32. මෙරට මාධ්‍ය අන්තර්ගතය තුළ දැකගත හැකි ප්‍රවණතාවයක් නොවන්නේ,

1. සරල භාෂා භාවිතය
2. වෙළඳ දැන්වීම් ප්‍රමාණාත්මකව ඉහළ යාම
3. බුද්ධිමය වශයෙන් වැඩිදියුණු වීම
4. ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදා ගැනීම
5. විනෝදාස්වාදය කෙරේ වැඩි අවධානයක් දැක්වීම

33. වර්තමානයේ බොහෝ මාධ්‍ය අයතනවල කාන්තා මාධ්‍යවේදීන්ගේ වැඩි මැදිහත්වීමක් පෙන්නුම් කරන බව වැඩසටහනකදී අනාවරණය විය. මෙමගින් ගම්‍ය වන්නේ,

1. මාධ්‍යකරුවන්ගේ ස්වාධීනභාවයයි
2. ස්ත්‍රී/ පුරුෂ සමාජ තත්ත්වයයි
3. සංස්කාරක නිදහසයි.
4. ස්ත්‍රීවාදයයි
5. මාධ්‍ය ආයතන ප්‍රධානින් වැඩි කාන්තා රුචිකයන් වන බවයි.

34. මාධ්‍ය වෙනුවෙන් පනවා ඇති නෛතික බාධක ඉවත් කිරීමේ ක්‍රියාවලිය හා ලිහිල් කිරීමේ ක්‍රියාවලිය වූ කලි.

1. අපරිනියාමයයි.  2. නිර්නියාමයයි.  3. පරිභෝජ්‍යවාදයයි.
4. භාණ්ඩකරණයයි.  5. ස්වයංනියාමනයයි

35. ජනමාධ්‍ය නියාමනයට අයත් වීමේ අවම ඉඩක් ඇත්තේ,

1. ආචාරධර්ම පද්ධතිය ස්ථාපනයයි.  2. ලියාපදිංචිකරණ ක්‍රියාවලියයි.
3. නිසි බලධාරීන් පත් කිරීමයි.  4. අණ පනත් සම්පාදනයයි
5. ස්වයං වාරණයයි.

36. නියාමන ක්‍රමවේදය තුළ දැඩි බවත් පෙන්නුම් කරන නියාමන ක්‍රමවේදය වන්නේ,

1. ස්වයං නියාමනය  2. සහ නියාමනය  3. ව්‍යවස්ථාපිත නියාමනය
4. අභ්‍යන්තරික නියාමනය  5. නිර්නියාමනය

37. යම් කෙනෙකුගේ නිර්මාණයක් සාධාරණ භාවිතයට අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

1. හිමිකම් ආරක්ෂා කර ඇති කාර්යයේ ස්වභාවය
2. වෙළඳපොල සඳහා භාවිතා කිරීමට ඇති බලපෑම
3. භාවිතා කරනු ලබන කාර්යය ප්‍රමාණය
4. කොටස් හිමිකම සහ අයිතිය වෙනුවෙන් ගෙවීම
5. භාවිතය හා එහි ස්වභාවය

38. Many Voices One World නම් මැක්බ්‍රයිඩ් වාර්තාව ප්‍රකාශයට පත් කරන ලද්දේ,

1. ශෝන් මැන්බ්‍රයිඩ් විසින්
2. යුනේස්කෝ සංවිධානය විසින්
3. විල්බර්ග්‍රාම් විසින්
4. හර්බට් සිලර් විසින්
5. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්

39. සමීක්ෂණ ක්‍රියාවලියකදී පිලිපැදිය යුතු ආචාර ධර්මයක් නොවන්නේ,

1. දත්ත හිතාමතා විකෘති කිරීම
2. වැරදි දත්ත ඇතුලත් නොකිරීම
3. වෙනත් අයෙකුගේ බුද්ධිමය දේපල අයුතු ලෙස භාවිතා නොකිරීම.
4. දත්ත ලබාදීම පිළිබඳ දත්ත දායකයා අගය කිරීම.
5. දත්ත දායකයාගේ ආරක්ෂාව තහවුරු කිරීම.

40. සමීක්ෂකයා විසින්ම සමීක්ෂණයේ අරමුණුවලට අදාලව විශේෂිතව එකතු කරනු ලබන දත්ත,

1. ගුණාත්මක දත්ත  2. ප්‍රමාණාත්මක දත්ත  3. ප්‍රාථමික දත්ත
4. ද්වීතියික දත්ත  5. නියැදිය

41. ජාතික සංවර්ධනය තුළ ප්‍රමුඛතාවය හිමි වනුයේ,

1. සදාචාරාත්මක සංවර්ධනය  2. දේශපාලන සංවර්ධනය  3. ආර්ථික සංවර්ධනය
4. සංස්කෘතික සංවර්ධනය  5. පාරිසරික සංවර්ධනය

42. අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් පුස්තකාලයට ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීමට ඔබට හැකියාව ඇත. මේ සඳහා සෘජුව බලපාන්නේ නව මාධ්‍යයේ කුමන ලක්ෂණයක්ද?

1. දත්ත සංචිතකරණය
2. අන්තර් ක්‍රියාකාරීත්වයයි
3. ස්වයංකරණය
4. ජාලගතකරණය
5. වේගවත් සංදේශකරණයයි

43. මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීමේදී අධිකරණ බලතල අර්ධ වශයෙන් හිමිවන්නේ,

1. ප්‍රධාන කතුවරයාට
2. ඕම්බුඩ්ස්මන්වරයාට
3. පුවත්පත් මණ්ඩලයට
4. පුවත් නිසි බලධාරියාට
5. පුවත්පත් පැමිණිලි කොමිසමට

44. වීඩියෝ, ප්‍රවෘත්ති, පූර්ව ප්‍රචාරක, දැන්වීම් ආදී කාර්යයන් සිදු කිරීම අයත් වන්නේ,

1. ව්‍යාපාර මහජන සම්බන්ධතාවයයි
2. රාජ්‍ය මහජන සම්බන්ධතාවයයි.
3. වෘත්තිය මහජන සම්බන්ධතාවයයි.
4. මාධ්‍ය මහජන සම්බන්ධතාවයයි.
5. ආයතනික මහජන සම්බන්ධතාවයයි.

45. චිත්‍රපටයක් සඳහා "A" සහතිකයක් නිකුත් කිරීමේ අදහස වන්නේ,

1. වැඩිහිටියන්ට වඩාත් සුදුසු බවයි.
2. වැඩිහිටියන්ට පමණක් බවයි.
3. අසීමාන්තික මහජන ප්‍රදර්ශණයට සුදුසු බවයි.
4. වයස 18ට වැඩි ඕනෑම අයෙකුට නැරඹිය හැකි බවයි.
5. වැඩිහිටියන් සමඟ පැමිණෙන වයස 18ට අඩු ළමුන්ටද නැරඹීය හැකි බවයි.

46. ජනමාධ්‍ය ඔස්සේ එක 'නිසරු සංදේශ' බහුල වශයෙන් සමාජගත වන්නේ,

1. රූප මාධ්‍යයේ ඇති ප්‍රහලතාවය නිසාය.
2. ශ්‍රව්‍ය මාධ්‍යයයේ ඇති ප්‍රබලතාවය නිසාය.
3. නර්තනය, ගායන, වාදන වලින් පිරී ඇති නිසාය.
4. විවිධ සංදේශ පසිඳුරන් පිනවන නිසාය.
5. අවිචාරවත්ව මාධ්‍ය භාවිත කිරීම නිසාය.

47. සිනමා පටකය විවිධ රූපරාමු භාවිතා කිරීමෙන් උපදවන අර්ථ වටහා ගැනීමට දියුණු කළ යුත්තේ,

1. විකේතන හැකියාවක්ය
2. මාධ්‍ය සාක්ෂරතාවය
3. විචාරශීලී මාධ්‍ය ග්‍රාහකත්වය
4. දෘශ්‍ය නිපුණතාවයයි.
5. සහානුභූතියෙනි

48. වියළි කලාපය කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක ''රජරට සේවය'' අයත් වන්නේ,

1. ජාතික ගුවන් විදුලි සේවයට
2. ප්‍රජා ගුවන් විදුලි සේවයට
3. ප්‍රාදේශිය ගුවන් විදුලි සේවයට
4. සංවර්ධනාත්මක ගුවන් විදුලි සේවයට
4. පොදු සේවා ගුවන් විදුලි සේවයට

49. ලෝකයට ජනමාධ්‍ය බිහි කිරීමේ තීරණාත්මක ජයග්‍රහණයේ ගෞරවය හිමිවිය යුත්තේ කාටද?

1. ගුග්ලිමෝ මාර්කෝනි
2. සැමුවෙල් මෝර්ස්
3. සායි ලුං
4. ජොහැන්සන් ගුටෙන්බර්ග්
4. ජොන් ලොගි බේයාඩ්

50. සමීක්ෂණ ආචාරධර්ම පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැකවේ.

A දත්ත ලබා ගැනීමකදී ගවේශකයාගේ බලය අයුතු ලෙස යොදා නොගැනීම.

B ඕනෑම අවස්ථාවක දත්ත දායකයාට සමීක්ෂණ ක්‍රියාවලියෙන් ඉවත් වීමේ අවස්ථාව ලබාදීම.

මෙම ප්‍රකාශ අතුරෙන්,

1. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
2. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
3. A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.
4. A හා B සත්‍ය වන අතර, A මගින් B තහවුරු කෙරේ
5. A හා B සත්‍ය වන අතර, B මගින් A තහවුරු කෙරේ

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය -II

29 S II

කාලය පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. ''සන්නිවේදන ක්‍රියාවලිය මානවයාගේ ජීවිතය වෙනස් කරන ලද්දකි.''

(i) පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් ලක්ෂණ 04ක් නම් කරන්න. **(ල. 04)**

(ii) අතථ්‍ය සන්නිවේදනයට අයත් ලක්ෂණ 04ක් නම්කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 08)**

(iii) සමූහ හා මහජන සන්නිවේදනය අතර පවත්නා වෙනස්කම් 03ක් විස්තර කරන්න. **(ල. 12)**

(iv) විද්‍යුත් ජනමාධ්‍යයේදී ඇතිවිය හැකි බාධක වර්ග දෙක උදාහරණ දෙක බැගින් ලබා දෙමින් පැහැදිලි කරන්න. **(ල. 16)**

02. ''සන්නිවේදනය විවිධාකාරය''

(i) මාධ්‍ය සංස්කෘතිය තුළින් වර්තමාන සාමාජයෙහි ඉටුකරන කාර්යය 04ක් නම් කරන්න.**(ල. 04)**

(ii) නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය සතු කාර්යභාර්යයන් 04ක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 08)**

(iii) සාම්ප්‍රදායික සන්නිවේදන විධි ක්‍රමයක් වන ජනකවිවල වැදගත්කම කරුණු 03ක් මගින් උදාහරණ සහිතව පහදන්න. **(ල. 12)**

(iv) විද්‍යුත් මාධ්‍යයට සාපෙක්ෂව මුද්‍රිත මාධ්‍යයේ වාසි 04ක් පැහැදිලි කරන්න. **(ල. 16)**

03. (i) ග්‍රාම්-ඔස්ගුඩ් ආකෘතියේ විශේෂතා 04ක් නම් කරන්න. **(ල. 04)**

(ii) මහජන සම්බන්ධතාව හා දැන්වීම්කරණය අතර වෙනස කරුණු 02ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. **(ල. 08)**

(iii) ආයතනයක තම අභ්‍යන්තර මහජන සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා භාවිතා කරනු ලබන විධික්‍රම තුනක් උදාහරණ සහිතව පහදන්න. **(ල. 12)**

(iv) අද්‍යතන සමාජයේ ගෝලීයකරණ සංස්කෘතිය සංසරණය වන්නේ අසමබර තාවයකින් යුක්තවය. කරුණු 04ක් මගින් පැහැදිලි කරන්න. **(ල. 16)**

04. (i) මාධ්‍ය සංස්දේශනයක් විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගත හැකි මූලික කරුණු 04ක් නම් කරන්න. (ල. 04)

(ii) රටක් අන්තර්ජාතික වශයෙන් මහජන සම්බන්ධතාව වැඩි දියුණු කර ගැනීම සඳහා අවධානයට ගත යුතු විධික්‍රම දෙකක් උදාහරණ සහිතව පහදන්න. (ල. 08)

(iii) ගුවන් විදුලි මාධ්‍ය සඳහා නිර්මාණාත්මක භාෂාව යොදා ගැනීමේදී අවධානයට ගත යුතු මූලික කරුණු තුනක් පැහැදිලි කරන්න. (ල. 12)

(iv) මාධ්‍ය දැන්වීම්කරණය මගින් සමාජයට සිදුවන බලපෑම් කරුණු 04 මගින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 16)

05. (i) බ්‍රිතාන්‍යජාතික ග්‍රැහැම් වෝල්ස්ගේ නිර්මාණාත්මක චින්තන ක්‍රියාදාමයට අයත් අදියර 04ක් නම් කරන්න. (ල. 04)

(ii) සමීකරණයේදී දත්ත රැස් කිරීම සඳහා යොදා ගත හැකි විධික්‍රම 02ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) සමකාලීන සමාජයේ තාක්ෂණයේ වර්ධනය හේතු කොටගෙන ඇති වී ඇති තාක්ෂණික ප්‍රවණතා තුනක් ශ්‍රී ලංකාව ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 12)

(iv) සිද්ධි කළමණාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම කරුණු 04ක් මගින් පැහැදිලි කරන්න. (ල. 16)

06. (i) ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලි නාලිකාව හා එය ආරම්භ වූ දශකය නම් කරන්න. (ල. 04)

(ii) රංගකලාවේ මූලිකාංග 02ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) ප්‍රචණ්ඩත්වය රූපවාහිණී මාධ්‍ය තුළ නිරූපනය වන ආකාරය වැඩසටහන් ආකෘති 03ක් ඇසුරින් පහදන්න. (ල. 12)

(iv) දේශකයෙක් දේශනයකදී අසාර්ථකවීමට බලපෑ හැකි හේතු 04ක් පැහැදිලි කරන්න. (ල. 16)

07. (i) දේශපාලන පදනමකින් විවරණය කර ඉදිරිපත් කර ඇති හැරල්ඩ්.ඩී.ලැස්වේල්ගේ සන්නිවේදන නිර්වචනය ලියා දක්වන්න. (ල. 04)

(ii) ජනතා මත ගොඩනැගීමේදී සමාජ මාධ්‍ය භාවිතයේ වැදගත්කම සාකච්ඡා විය. ඒ සඳහා යොදා ගත හැකි සමාජ මාධ්‍ය මෙවලම් දෙකක් සඳහන් කර ඒ මගින් ජනතා මතය ගොඩනංවන ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) වර්තමාන නිර්මාණාත්මක සන්නිවේදන කාර්යේදී ජනශ්‍රැති භාවිතා කළ හැකි ආකාරය උදාහරණ තුනක් ඇසුරින් පහදන්න. (ල. 12)

(iv) රටක් දේශපාලන ව්‍යාකූලතාවයට පත් වූ අවස්ථාවක ජනමාධ්‍යයේ කාර්යයභාර්ය කෙසේදැයි කරුණු 04ක් මගින් සුදුසු නිදසුන් සපයමින් පැහැදිලි කරන්න. (ල. 16)